## පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය - දකුණු පළාත

## දකුණු පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2023

දකුණු පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති දකුණු පළාතේ ස්ථිර පදිංචි අධ්‍යාපනවේදී උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම බඳවා ගැනීම සිදු කරන අතර පවතින ප්‍රතිසම්පාදන හා සේවා අවශ්‍යතාවය මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. මෙහිදී සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර එහිදී ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ මුළු කුසලතාවයේ අනුපිළිවෙල මත බඳවාගැනීම් කටයුතු සිදු කෙරේ.

### 2. වැටුප් ක්‍රමය :

මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(iv) හි ජී-ඊ-1-2016 - ඒ දරණ වැටුප් ඛණ්ඩණයට අදාළ රු.39,175 – 10x825 – 7x1,335 – 20x1,630 - රු.89,370- වේ.ඔබ මෙම වැටුප් පරිමාණයේ 03 වන පියවර වන රු.40,825/- වැටුප් තලයේ පිහිටවනු ලැබේ.

### 3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

3.1. අධ්‍යාපන සුදුසුකම් :

i. ඉගැන්වීම් කාර්යයක් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපලේඛන 01 හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ **අධ්‍යාපනවේදී උපාධියක්** ලබා තිබිය යුතුය. මෙම උපාධිය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර වලංගු උපාධියක් විය යුතුය.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක මව්බස සහ ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සමඟ විෂයයන් හයක් (06) සමත් වීම. (එක් වතාවක දී අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත්ව තිබිය යුතුය.)

සහ

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනක් (03) සහිතව එම විභාගය සමත්ව තිබිය යුතුය.

***ඉතා වැදගත් :*** (අයදුම් පත්‍රය සම්පූර්ණ කිරිමේ දී සැලකිල්ලට ගත යුතුය.)

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැළකිලිමත් විය යුතුය.
- එහිදී ප්‍රවීණතාවය ලද විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතු ය.
- ඉල්ලුම් කළ හැක්කේ විෂයයන් **දෙකක්** සඳහා පමණි.
- ඉල්ලුම් කළ විෂයය හා මාධ්‍යය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.
- 1988.08.18 දිනැති 27/88 අංක දර "ආබාධිත පුද්ගලයන්ට රැකියා සැපයීම" මැයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ද කටයුතු කරනු ඇත.

3.2 කායික හා මානසික යෝග්‍යතාවය -

සැම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.3 වයස

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2023.10.31 දිනට) වයස අවුරුදු 18 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය.

3.4 වෙනත් සුදුසුකම් -

I. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු/අයදුම්කාරිය විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරු හෝ කලත්‍රයා, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් දකුණු පළාත තුළ ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුය.(ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්.04) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.

IV. බඳවාගැනීම් සිදු කිරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කරනු ලබන අතර අයදුම්කරුවන් තම මනාපය පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05ක් සඳහන් කළ යුතු වේ. ( පළමු වරණය, තම ස්ථිර පදිංචිය සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය විය යුතු ය.

V. යම් විෂයයකට අදාළ ව කිසියම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ස්ථිර පදිංචිය සහිත උපාධිධාරීන් අදාළ පුරප්පාඩු පූරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට පමණක් වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි අයදුම්කරුවන් පිළිබඳ ව සලකා බලනු ලැබේ.

VI. දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

4. **සේවා කොන්දේසි** :

I. රාජ්‍ය /පළාත් සහා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුර ස්ථිරය.විශ්‍රාම වැටුප් සහිතය.මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

III. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

IV. දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

V. 2020.10.16 දිනැති රා.ප.ච.18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**5. බඳවා ගැනීම :**

5.1. බඳවා ගැනීමේ ක්‍රමය :

2008.07.01 දින සිට ක්‍රියාත්මක දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.5 වගන්තිය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

තෝරාගැනීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වේ.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පසුව ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. (ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.3. (අ) වගන්තිය බලපැවැත්වේ.)

ප්‍රායෝගික පරීක්ෂණයේ ලබා ගත් ලකුණු මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පවතින පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ.

මෙම විභාග නිවේදනයේ ප්‍රතිඵල මත සිදුකරනු ලබන බඳවාගැනීම, 2023.06.30 දිනට පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා පමණක් වලංගු වේ.

5.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

5.3 ප්‍රායෝගික පරීක්ෂණය -

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| **අනු අංකය** | **ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| 01. | අරමුණු හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04. | කාල කළමනාකරණය | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | **25** | **10** |

5.4 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය -

I. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 05කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
II. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි.(25).
III. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.
IV. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

5.5 නිර්ණායකයන්හි අරමුණු -

I. අරමුණ හා ප්‍රවිශ්ට වීම.
සාර්ථකව පාඩමේ අරමු පැහැදිලි කිරිම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

II. පෞරුෂය හා හඬ පාලනය.
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

III. සන්නිවේදනයේ පැහැදිලි බව.
ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිෙ අදාල කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

IV. ාල කළමණාකරණය.
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය.
අරමුණ කෙරෙහි ලඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව.

6. විභාග ගාස්තු :

විභාග ගාස්තු ලෙස රු.400/- ක මුදලක්, සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේ දී දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සරප් නිලධාරී මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2003-2-13 ට බැර වන පරිදි මුදලින් ගෙවීම් කර තමා නමින් ලබා ගනු ලබන කුවිතාන්සිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

මුල් කුවිතාන්සිය හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සි හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලැබේ. කිසිඳු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බවද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බවද සැලකිය යුතුය.

7. අයදුම්කළ යුතු පිළිවෙල -

I. සියලුම අයදුම්කරුවන් www.edumin.sp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදු කළ හැකි ය.

II. අදාළ තොරතුරු ඇතුළත් කරමින්, අයදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. (ඉංග්‍රීසි මාධ්‍යයෙන් කැපිටල් අකුරින් පමණක් සම්පූර්ණ කළ යුතු වේ.) අයදුම්පත පිරවීමේදී යොමු කර ඇති උපලේඛන 01,02 උපයෝගී කර ගත යුතුය.

III. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි අනු පිටපතක් අයදුම්කරු සතු ව තබාගැනීම අනිවාර්යය වන අතර එය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.

IV. අයදුම් කරනු ලබන විෂයය, විෂයය සඳහා මනාප අනුපිළිවෙල (1,2) සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අනුපිළිවෙල පසුව වෙනස් කිරීමට කිසිසේත් ඉඩ නොලබන අතර එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

අයදුම්පත සමග කිසිඳු සහතිකයක් අමුණා නොඑවිය යුතු ය.

V. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

අයදුම්පතෙහි අත්සන සහතික කිරීමට බලයලත් අයකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිළධාරීවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරීවරයෙකු, රු.498,960/- ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරණ නිළධාරීයෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැලැකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු හෝ යන අයවලුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කරනු ලැබ තිබිය යුතු අතර, අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

VI. අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - 2023.10.31

VII. බාගත කර නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, **<u>අයදුම්කරුගේ අත්සන සහිත ව හා අත්සන සහතික කරගැනීමෙන් අනතුරු ව 2023.10.31</u>** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදින ට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බිම් මහල, "දක්ෂිණපාය" අමාත්‍යාංශ සංකීර්ණය,
ලබුදූව, ගාල්ල.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලි ව **<u>"දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගුරු තනතුරකට අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවාගැනීම - 2023"</u>** යන්න සහ **අයදුම් කරනු ලබන විෂයයන් 02** සඳහන් කළ යුතු ය.

8. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

9. මෙම බඳවාගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසන් තීරණය හා මෙම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සතුය.

10. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට අදාළ ව ඒ බව සඳහන් කරමින් නිවේදනයක්, කැඳවීමේ ලිපිය සහ සම්මුඛ පරීක්ෂණ කාලසටහන දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය www.edumin.sp.gov.lk මඟින් පළ කරනු ඇත. ඒ බව කෙටි පණිවුඩයක් මගින් ද ඔබ වෙත දැනුම් දෙනු ඇත.

11. ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයට අනුව සම්මුඛ පරීක්ෂණ කාලසටහනෙහි ඔබගේ විස්තර ඇතුලත් වී නොමැති නම් ඒ බව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විමසිය හැකි ය. එහිදී ඔබ විසින් ලඟ තබා ගත් අයදුම්පතෙහි අනු පිටපත හා ලියාපදිංචි තැපෑලේ අංකය සමග ඒ බව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අංශයෙන් විමසිය යුතුය.

12. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවනු ඇත. මේ සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතු ය. එසේ වුව ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

14. පත්වීම් ලිපියේ සඳහන් ව ඇති පත්වීම් දින සිට දින 14ක් ඇතුලත වැඩ භාරගැනීම සිදු කළ යුතු අතර, එසේ නොවුනහොත් නැවත දැනුම් දීමකින් තොරව පත්වීම අවලංගු වේ.

උපලේඛණය 01

පුරප්පාඩු පවතින විෂයයන් හා මාධ්‍යයන් පහතින් දක්වා ඇත. ඒ අනුව ඉල්ලුම් කරනු ලබන විෂයය හා මාධ්‍ය තෝරා ගත යුතු ය.

| *අනු අංකය* | *විෂයය* |
|---|---|
| 01 | ප්‍රාථමික |
| 02 | ඉංග්‍රීසි |
| 03 | නැටුම් (දේශීය) |
| 04 | නැටුම් (භාරතීය) |
| 05 | සංගීතය(පෙරදිග) |
| 06 | සංගීතය(අපරදිග) |
| 07 | සංගීතය (කර්ණාටක |
| 08 | නාට්‍ය හා රංග කලාව |
| 09 | චිත්‍ර |
| 10 | විද්‍යාව |
| 11 | ගණිතය |
| 12 | භූගෝල විද්‍යාව |
| 13 | පුරවැසි අධ්‍යයනය |
| 14 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය |
| 15 | කොරියන් |
| 16 | ජපන් |

| | |
|---|---|
| 17 | දෙවන බස (දෙමළ) |
| 18 | ගෘහ ආර්ථික විද්‍යාව |
| 19 | සිංහල භාෂාව හා සාහිත්‍ය |
| 20 | දෙමළ භාෂාව හා සාහිත්‍ය |
| 21 | ඉතිහාසය |
| 22 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය |
| 23 | ගිණුම්කරණය |
| 24 | ව්‍යාපාර අධ්‍යයනය |
| 25 | ආර්ථික විද්‍යාව |
| 26 | රසායන විද්‍යාව |
| 27 | භෞතික විද්‍යාව |
| 28 | ජීව විද්‍යාව |
| 29 | කෘෂි විද්‍යාව |
| 30 | සංයුක්ත ගණිතය |
| 31 | ඉංජිනේරු තාක්ෂණවේදය |
| 32 | ජෛව පද්ධති තාක්ෂණවේදය |
| 33 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව |
| 34 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| 35 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය |
| 36 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා |
| 37 | ප්‍රාසාංගික කලාව |
| 38 | කාර්ය සිද්ධි කළමණාකරණය |
| 39 | ශිල්ප කලා |

| | |
|---|---|
| 40 | අභ්‍යන්තර නිර්මාණකරණය |
| 41 | විලාසිතා නිර්මාණකරණය |
| 42 | ග්‍රැෆික් නිර්මාණකරණය |
| 43 | භූ දර්ශන නිර්මාණකරණය |
| 44 | පශු සම්පත් නිශ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| 45 | ආහාර නිශ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| 46 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය |
| 47 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය |
| 48 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය |
| 49 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය |
| 50 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය |
| 51 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| 52 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| 53 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය |
| 54 | නිෂ්පාදනය |
| 55 | සංචරණය හා ආගන්තුක සත්කාර |
| 56 | විශේෂ අධ්‍යාපනය |

උපලේඛණය 02

අයදුම්කරුවන් විසින් තෝරා ගත යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|
| 101 | අක්මීමණ |
| 102 | අම්බලන්ගොඩ |
| 103 | බද්දේගම |
| 104 | බලපිටිය |
| 105 | බෙන්තොට |
| 106 | බෝපේ - පෝද්දල |
| 107 | ඇල්පිටිය |
| 108 | ගාල්ල |
| 109 | ගෝනාපීනුවල |
| 110 | හබරාදූව |
| 111 | හික්කඩුව |
| 112 | ඉමදූව |
| 113 | කරන්දෙණිය |
| 114 | නාගොඩ |
| 115 | නෙළුව |
| 116 | නියාගම |
| 117 | තවලම |
| 118 | වැලිවිටිය - දිවිතුර |
| 119 | යක්කලමුල්ල |
| 120 | වඳුරඹ |
| 121 | රජ්ගම |
| 122 | මාදම්පාගම |
| 123 | අකුරැස්ස |
| 124 | අතුරලිය |
| 125 | දෙවිනුවර |
| 126 | දික්වැල්ල |
| 127 | හක්මණ |
| 128 | කඹුරුපිටිය |
| 129 | කිරින්ද පුහුල්වැල්ල |
| 130 | කොටපොල |
| 131 | මාලිම්බඩ |
| 132 | මාතර |
| 133 | මුලටියන |

| | |
|---|---|
| 134 | පස්ගොඩ |
| 135 | පිටබැද්දර |
| 136 | තිහගොඩ |
| 137 | වැලිගම |
| 138 | වැලිපිටිය |
| 139 | අම්බලන්තොට |
| 140 | අඟුණුකොළපැලැස්ස |
| 141 | බෙලිඅත්ත |
| 142 | හම්බන්තොට |
| 143 | කටුවන |
| 144 | ලුණුගම්වෙහෙර |
| 145 | ඕකෙවෙල |
| 146 | සූරියවැව |
| 147 | තංගල්ල |
| 148 | තිස්සමහාරාමය |
| 149 | වලස්මුල්ල |
| 150 | වීරකැටිය |